3 වන පිටෙන්

ගැලවීමටවත්, සමාජ ක්‍රමය වෙනස් කිරීමටවත් , ආණ්ඩු පෙරලීමටවත් දවල් සිහින දකින්නට කාලය මිඩංගු කිරීමට මේ අවස්ථාව නොවේ. මේ එළඹ ඇත්තේ ඔබේ දරුවා බූරුවකු බවට පත්වීමේ අවාසනාවන්ත ඉරණමෙන් බේරා ගන්නට ඔබට ඇති අවසාන නිමේෂයයි.

නැතිනම් ඔබට ගයන්නට වන්නේ බොල බූරු පුතේ යන දෙව්ලෝ යනකං නාට්‍යයේ ගීතයයි.

දමිල ජනයා පිළිබඳ සිංහල ඔබ නැගූ චෝදනා අතරින් එකක් වූයේ දොස්තරවරුන් , උගතුන් , ඉංජිනේරුවන් , නීතිවේදීන් ආදී බොහෝ දෙනෙකු දමිලයන් වීම දරා ගත නොහැකි වීමේ චෝදනාවයි. මේ වන විට අධිරාජ්‍යවාදීන් විසින් විශේෂ වරප්‍රසාද දීමෙන් ඇති කළායැයි කියන එම තත්වයද පරාජය කොට ඇත. මෙහි ඇතිවූ සියලු මර්ධනයන් තුළදී සිංහල දෙමල භේදයකින් තොරව උගත් තරුණයන්ගේ කරදරය අහවර කෙරිණි. 89න් පසු සියලු සාහිත්‍ය කලා සමාජ සංවාදයන්හි හිස් පුටු දකින්නට භාග්‍යය අපට හිමි විය. ගමේද නගරයේද කියා වෙනසකින් තොරව නූගත් අලජ්ජි බූරුවන් අහිනක් සහ ලුම්පන් තිරිසනුන් රොත්තක් ජනතා නියෝජිතයන් ලෙස පත් විය. සියලු උත්තරීතර ආයතනයන් තිරිසනුන් විසින් අරක් ගැණිනි. මේ ලුම්පන් අප්පාවරුන්ට සරිලන, මේ ලුම්පන් ක්‍රමයට ගැලපෙන ලුම්පන් අධ්‍යාපනයක් දියත් කිරීමට පිඹුරුපත් සැකසිණි. ජනමාධ්‍ය මේ තිරිසන් බව ලුම්පන් බව අභිනන්දනය කරන්නට ගත්හ.

පිනෝකියෝගේ පියා ගෙපෙටෝ අසීරුවෙන් පිනෝකියෝට හෝඩි පොත මිලට ගෙන දෙයි. දරුවන් සරසවියට යවන්නට ගම්වල බොහෝ මව්පියන් ගේදොර ඉඩකඩම් උගස් කරති. නාගරික මව්පියෝ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් සිය ජීවිත පිටින්ම උගස් කරති.

අම්මේ තාත්තේ තව දුරටත් ඔබ ඔබේ දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් ඔබේ ජීවිත උගස් තැබීමේ තේරුමක් නැත. එක්කෝ මේ කපටි නරියාටත් දුෂ්ඨ බළලාටත් උන්ගේ අප්පලාටත් එරෙහිව සටන් කරන්න. නැතිනම් ඔබේ දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් ඔබේ ජීවිතය උගස් තැබීම වහාම නවත්වන්න.

දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට හයක් රටේ අධ්‍යාපනයට වැය කිරීමට කනිපින්දම් ගසන රජයක් තවමත් පාසල් පොත්වල නිදහස් අධ්‍යාපනයේ පියා යැයි සී.ඩබ්.ඩබ්. කන්නංගර ශ්‍රීමතාණන්ව විලිලජ්ජාවකින් තොරව සඳහන් කරයි. දලජාතික නිෂ්පාදනයෙයන් රටේ ඒ ඒ දේවලට වෙන් වන අනුපාතයන් සැසඳීමට ගියහොත් ඔබගේ මුබ පූට්ටු වනු ඇත. මෙසේ තිබියදී සිරිල් පොන්නම්පෙරුම වැනි විශ්ව කීර්තියට පත් බුද්ධිමතුන් ගැන වහසි බස් දොඩන්නටත් ඇතැමුන්ට ලැජ්ජාවක් නැත. මින් ඉදිරියට සිරිල් පොන්නම්පෙරුමලා අවශ්‍ය නැත . අවශ්‍ය බූරුවන් පමණය. බූරුවන්ට පාලනය කරන්නට බූරුවන් සිටිය විට ලෙහෙසිය.

අප රට සාක්ෂරතාව පිළිබඳ පම්පෝරි කලක සිට අප අසා ඇතිමු. අප රටේ දෙමාපියන් වැඩි හරියක් සිය ආදායම වැය කරනුයේ දරුවන්ගේ අධ්‍යාපනය උදෙසාය. දරුවන් සේම මව්පියන්ද නොවිඳිනා දුක් අධ්‍යාපනය වෙනුවෙන් විඳිති. දරුවන්ට ළමා කාලය, සිය නව යොවුන් විය සේම දෙමාපියන්ට සිය තරුණ කාලයද මේ වෙනුවෙන් අහිමි වේ. අප රට තුළ පංති සංක්‍රමණයේ ප්‍රධාන මාදිලියක් වන්නේ අධ්‍යාපනයයි.

මේ වන විට රට තුළ පංති බෙදීමක් නැතිය යන මායා දර්ශණයක් සියල්ලන්ගේ සිත් තුළ එලා තිබේ. සැබැවින්ම මෙහි අන් කවරදාකවත් නොවූ විරූ ලෙස පංති බෙදීම සිදු වන්නේ මෙකල්හිය. එවන් කලෙක පැරණි ස්ථර ක්‍රමයෙන් වාෂ්ප වී නව ස්ථර බිහිව ඒ. එම නව ස්ථරයන්ට ස්ථාන ගත වන සැවොම තමන් පංති හිණිපෙතේ ඉහලින් සිටිනවාය යන මායාවෙන් අන්ධව සැරි සරති. සියළු මිනිසුන් මනුස්ස දූලි බවට පත් කරන මෙම අවධිය අතිශය සංක්‍රාන්තික වූවකි.

මරුටියක් තිබූ පමණින් ඔබ ධනපතියකුවත් ඉහළ මධ්‍යම පංතිකයකුවත් නොවේ .එම මෝහයත් මුලාවත් ඔබව ගෙන යනු ඇත්තේ පරිභෝජනවාදය තුළ, වෙළඳ භාණ්ඩ වන්දනාවාදය හරහා ඉතාමත්ම අනාරක්ෂිත තත්වයකටය. යුරෝපයේ කම්කරුවන්ටත් කාර් එකක් තිබේ. ධනපති හෝ සුලු ධනේශ්වර බව මේ වනවිට ජගුවරය ලිමුසීනය කරා පොලා පැන තිබේ. බොහෝ සුළු ධනේශ්වරයන් යනු උගත් පරිපාලන හෝ සේවා සපයන කම්කරුවන්ය. කලාකරුවාගේ සහ කම්කරුවාගේ පවා වෙනස මේ වන විට ඇකී මැකී ගොස් තිබේ. මොකක් හෝ කඩ කෑල්ලක් දා ගත් පලියට සුලු ධනේශ්වර වන්නට පුලුවන් යුගයක් අතීතයේ තිබිණි. කායික ශ්‍රමය වෙහෙසනා එයට වැටුප් ලබන්නා නිර්ධනයාය යන පැරණි සීමාව ඇකී මැකී ගොස් තිබේ. කෙසේ හෝ කේන්ද්‍රයේ අධිරාජ්‍යවාදී රටවල පුරවැසියන් නොකරන නොවැදගත් වැඩ කිරීමට මනුස්ස දූලි පමණක් මේ වන විට එම රටවලට මෙවන් පරිවාරයේ රටවලින් අවශ්‍යව තිබේ. අධ්‍යාපනය ඊට සීමා වීම උන්ට සෑහේ.

විදේශ විශ්ව විද්‍යාලවලට හෝ පෞද්ගලික විශ්ව විද්‍යාලවලට, අන්තර්ජාතික පාසල්වලට සිය දරුවන් යැවීමට සමත් පිරිසට ඇතැම් විට ඔබ අයත් වනවා වන්නට පුලුවන. එහෙත් හෙට දින ඔබේ දරුවාට ගනු දෙනු කිරීමට වන්නේ, පාලනය කිරීමට වන්නේ, මහමග ගමන් කිරීමට වන්නේ බූරුවන් සමග නම් ඒ වරප්‍රසාදිත තත්වයෙන් කුමන පලක් වේද? හෙට ඔබේ දියණිය මේ බූරුවකු අතින් දූෂණයට පත් විය හැක. ඔබේ පුතා මේ බූරුවකු අතින් මිය යන්නට පුලුවන.

තරුපහේ හෝටල්වල අහර වළඳින්නෝ සිටිති. කුඩා අවන්හල්වල අහර ගන්නෝද සිටිති. තරුපහේ හෝටල්වල බුදින්නන් අනෙක් කුඩා හෝටල හෝ කුඩා අවන්හල් වසා දමන්නට කටයුතු කරන්නේවත් ,ඒවා වැසී යන තැනට කටයුතු සිද්ධ කරන්නේවත් නැත.

සියලු සත්වයෝ ආහාරයෙන් යැපෙතියි බුදුරදුන් වදාළේය. එසේම සියලු මනුෂ්‍යයෝ අධ්‍යාපනයෙන් යැපෙති. ඔවුන් මනුෂ්‍යයන් බවට පත් වන්නේ අධ්‍යාපනයෙනි.

ආහාරයේ සමබර බව, ගුණාත්මකතාව කෙසේ වේවා සියලු සත්වයන්ට ආහාර අවශ්‍යය. අධ්‍යාපනයේ ගුණාත්මක බවද එවන්ය.

අධ්‍යාපනය යනු දැනුම ලබා ගැනීම පමණක්ම නොවේ. එය ශිෂ්ඨත්වය සහ මනුෂ්‍යත්වද අත්පත් කොට ගැනුමයි. එය මිනිසුන් උගතුන් කරනු පමණක් නොව මනුෂ්‍යයන්ද කරයි. නොඑසේව උගත් බූරුවන්ද සිටින බව ඇත්තය. එහෙත් නූගත් බූරුවන්ට වඩා උගත් බූරුවන් පවා උසස්ය.

ලොව පුරා සියලු කල්හි බූරුවා එක් කාරණයක් සංකේතවත් කරන්නක් ලෙස යෙදී තිබේ. අම්මේ තාත්තේ ඔබේ දරුවාට මනුෂ්‍යාත්මභාවයක් ලබා දෙන්න.

ලෝක ධනේශ්වරයේ විපරීත කොන්ත්‍රාත්කරු ජේ ආර් ජයවර්ධනගේ සම්පූර්ණ නොකළ කොන්ත්‍රාත්තුව එදා ඔහුට විරුද්ධ වූ ඔහුගේ මුනුබුරන් වන වත්මන් පාලකයන් විසින් ජාතික- වාම- බෞද්ධ වෙස් මුහුණක් පැළඳ කරගෙන යනු ලබයි. රනිල් වික්‍රමසිංහ වෙස්මූණු පළඳන්නට සමත් නොවූ නිසා ලෝක ධනේශ්වරය මෙන්ම ඔබද ඔහුව කුණු කූඩයට වීසි කොට තිබේ. එහෙත් ඔහු ලවා කර ගන්නට ගිය කටයුතුම ඔහු විසින් කරන්නට අර ඇඳි විට ඔබ විරුද්ධ වූ දේම දැන් ඔබගේ ආශීර්වාදය මැද ජේ ආර්ගේ මේ විපරීත මුනුබුරු කැලන විසින් කරගෙන යනු ලබයි.

ක්‍රමය වෙනස් කිරීමවත් ආණ්ඩු පෙරලීමවත් ගැන සිහින නොදැක , ඔබ යූඑන්පිකාරයකු ජේවීපිකාරයකු සන්ධාන හෝ හෙළඋරුමකරුවකු පෙරටුගාමී පාක්ෂිකයකු හෝ පෙරටුගාමී සමාජවාදියකු හෝ අන්කවරකු වේවා , කවර ජාතියකට කුලයකට , ආගමකට, වෘත්තියකට, පන්තියකට, තරාතිරමකට, කවර දර්ශණයකට , ගුරුකුලයකට අයත් වේවා ඔබේ යුතුකම ඉටු කරන්න. ඒ මුදලින්ද ශ්‍රමයෙන්ද, වචනයෙන්ද අන්තර්ජාලයෙන්ද, පාසලේ කාර්යාලයේ හෝ වැඩබිමේද තැබෑරුමේද යන්න නොතකා ඔබේ යුතුකම ඉටු කරන්න . ආදරණීය අම්මේ තාත්තේ ඔබත් ඔබේ දරුවා බූරුවෙක් කරන්නට සදන කපටි නරියාටත් , දුෂ්ඨ බළලාටත් , උන්ගේ අප්පලාටත් එරෙහිව මේ සටනට සහාය දෙන්න.

ඔබේ දරුවා බූරුවකු බවට පත් කරන්නට කැස කවන මේ කපටි නරියාටත් දුෂ්ඨ බළලාටත් උන්ගේ අප්පලාටත් එරෙහි වීමෙන් හෝ නොවීමෙන් ඔබ බූරුවකු වන නොවන බව ඔබම තීරණය කරන්න.

**කේ.කේ සමන් කුමාර**

## සන්නස Cartoon by PK




මාලකව කැලණියේදී අත්අඩංගුවට ගත්තේ නැත්තේ ඒ අවස්ථාව සුදුසු නැති නිසයි - කෙහෙළිය







PK ගේ කාටූන් රසවිඳින්නට දිනපතා www.sannasa.net අඩවියට ගොඩවන්න

**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**

03 8707 4604 / 0402 025 516

**email** sannasanews@gmail.com ads.sannasa@gmail.com